සිංහල පරිවර්තනය

නිවේදන අංක:- **R/2025/03**

<u>උතුරු පළාතේ පාසැල්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රීලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025</u>

උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NP/01/01/08/01/01 දරණ 2024.11.27 දිනැති ලිපිය මගින් යොමු කරන ලද උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක NP/3/1/4/Gra.Tea/2023 දරණ 2024.11.20 දිනැති ලිපිය, උතුරු පළාත් ගුරු ආණ්ඩුකාරතුමාගේ 2025.01.24 දිනැති අනුමැතිය සහ 2021.01.26 දිනැති අංක 2021/01 දරණ ආණ්ඩුකාරවර සංදේශය මගින් පළකරන ලද බලය පැවරීම යනාදියට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර, සම්පූර්ණ නොකරන ලද උතුරු පළාතේ පාසැල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා (**ඇමුණුම - 01** හි සඳහන් පරිදි) උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **ඇමුණුම - 02** හි සඳහන් විෂයයන් සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් අයදුම්කරන ලෙස දන්වා සිටිනු ලැබේ. **ඇමුණුම - 01** හි සඳහන් විෂයයන් සඳහා පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.07.18** වේ.

**02.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරණ 2014.10.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාව සහ එහි සංශෝධනවල සඳහන් කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව තෝරාගන්නා අයදුම්කරුවන් **ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ I (අ) ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

02.2. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. මෙම බඳවා ගැනීම මගින් තෝරාගන්නා අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

02.3. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4. පත්වීම් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

02.5. පත් කරනු ලබන පාසැල පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර, ඕනෑම තීරණයට අයදුම්කරු යටත් විය යුතුය.

02.6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

**03.** වැටුප් පරිමාණය

3 වන පන්තිය - I (අ) ශ්‍රේණියේ තනතුරට අලුතෙන් පත්කරනු ලබන ගුරුවරයෙකුට පත්වීම ක්‍රියාත්මක වන දින සිට අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, **GE 1 - 2025** අනුව රු. **53,060 - 800 x 6 - 940 x 7 - 1,080 x 2 - 66,600/=** වන මාසික වැටුප් පරිමාණයේ 14 වන වැටුප් පියවර වන රු.64,440/= හි පිහිටුවන අතර, එම චක්‍රලේඛයේ **"III උපලේඛනය"** අනුව වැටුප් ගෙවනු ලැබේ. තවද රජය විසින් නියම කරනු ලබන අනෙකුත් දීමනා ද ලැබීමට හිමිකම් ලබයි.

**04.** සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය

04.2. අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිරව පදිංචි වී සිටිය යුතු වේ.

හෝ

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය.

සටහන:- **සම්මුඛ පරීක්ෂණයේ දී තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය**

04.3. ඒ අනුව, උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ මත, සිංහල මාධ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා, ඉහත **4.2** වගන්තියේ සඳහන් ආකාරයට උතුරු පළාතේ පදිංචි අයදුම්කරුවන් **බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ නොකරන අවස්ථාවක දී පමණක්,** තෝරාගැනීම සඳහා සළකා බලනු ලැබේ, යන කොන්දේසිය යටතේ සිංහල මාධ්‍ය පුරප්පාඩු සඳහා උතුරු පළාතේ පළාත් සීමාව හා සම්බන්ධ පහත සඳහන් පළාත් වලින්, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළදී අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් පදිංචි පුද්ගලයන් සඳහා අයදුම් කළ හැකිය.

- නැගෙනහිර පළාත
- උතුරු මැද පළාත
- වයඹ පළාත

සටහන:- **සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ ඡන්ද හිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.**

04.4. අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි ඉටුකිරීම හැකි යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතු අතර මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

04.5.

4.5.1.1 බඳවා ගැනීමේ නිවේදනය අනුව එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ අනුව එක් අයදුම්පත්‍රයක් පමණි.

4.5.1.2 එක් අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ උපරිම වශයෙන් විෂයයන් දෙකක් (එක් භාෂා මාධ්‍යකින්) සඳහා පමණක් වන අතර, අයදුම් කළ විෂයයන් පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

4.5.1.3 අයදුම්කරු කුමන භාෂා මාධ්‍යයකින් අයදුම් කරන්නේ ද **එම භාෂා මාධ්‍යයෙන්ම විභාගයට මුහුණු දිය හැකිය.**

4.5.1.4 තම කැමැත්තේ අනුපිළිවෙල අනුව විෂයයක් සඳහන් කළ යුතුය.

4.5.1.5 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අයදුම්පතේ තමා සඳහන් කළ බඳවා ගැනීමේ භාෂා මාධ්‍යයෙන්ම පෙනී සිටිය යුතුය.

4.5.1.6 මා විසින් කැඳවා ඇති ගුරු පුරප්පාඩු සඳහා වන සුදුසුකම් සහිත උපාධියේ විෂයය ඒකකයන් පිළිබඳ සැකයන් මතුවන අවස්ථාවක, පත්වීම් බලධාරියා / පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

04.6. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර **සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

04.7. **වයස් සීමාව :-** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 18** ට නොඅඩු සහ වයස **අවුරුදු 35** ට නොවැඩි විය යුතුය.

**05.** අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

05.1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරණ 2014.10.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව 2025.07.18 දින හෝ ඊට පෙර අධ්‍යාපන විෂයය භාර අදාළ රේඛීය අමාත්‍යාංශය මගින් ගුරු පත්වීම් සඳහා පිළිගත් විශේෂ විෂයය ක්ෂේත්‍රවලට අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනමන ආයතනයක් මගින් පිරිනැමූ විශ්වවිද්‍යාල උපාධි සහතිකයක් (ඇමුණුම - 02 හි සඳහන් කර ඇති පරිදි) ලබා තිබිය යුතුය. උපාධි ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05.2. ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමත්ව තිබිය යුතුය.

**06.** බඳවා ගැනීමේ පරිපාටිය

06.1. තරඟ විභාගයෙන් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා සුදුසුකම් ලබන අයදුම්කරුවන් අතරින්, ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල අනුව තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සළකා බලා සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී තනතුරට අදාළ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. එනමුත් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. 12.2 වගන්තියේ සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය හා ලිඛිත පරීක්ෂණය යන පරීක්ෂණ දෙකෙන්ම ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල (Merit Order) අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් ලබාදෙනු ලැබේ.

06.2. ඉහත 6.1 හි සඳහන් ආකාරයට බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිතවූවන් සඳහා වෙන් වූ ප්‍රතිශතය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 ප්‍රකාරව සලකා බලනු ලැබේ. අපේක්ෂකයෙකු පත්වීමක් සඳහා තෝරාගැනීමේ දී අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීමට තම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

**07.** විභාග ගාස්තු

07.1 4.2 වගන්තියෙහි සඳහන් ආකාරයට අයදුම්කරන අයදුම්කරුවන්, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි **උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්** ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

07.2 එනමුත්, **4.3 වගන්තියෙහි සඳහන් ආකාරයට අයදුම්කරන අයදුම්කරුවන් පමණක්** විභාග ගාස්තු ලෙස රු.500/= ක මුදලක් ඕනෑම තැපැල් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට **යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් (Money Order) ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

**08.** අයදුම්කිරීමේ පිළිවෙල

08.1. මෙම නිවේදනය සමග අමුණා ඇති අයදුම්පත ස්වකීය අත්අකුරින් සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කළ අයදුම්පත් 2025.07.18 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

08.2. අයදුම්පත්‍රයේ අංක 01 යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේ දී, තමන්ගේ නම (ලබා දී ඇති නම) සඳහන් කළ යුතු අතර, තම නමට අදාළ සියලුම මුල් අකුරු නමේ අගට සඳහන් කළ යුතුය. ඒ සමග අයදුම්පත්‍රයේ අංක 02 යටතේ අයදුම්කරුගේ සම්පූර්ණ නම සඳහන් කිරීමේ දී අයදුම්කරුගේ නමට යටින් ඉරක් ඇඳිය යුතුය.

**උදාහරණ:-** අයදුම්පත්‍රයේ අංක 01 හි මුල් අකුරු සමග අයදුම්කරුගේ නම: **අංජලී .කේ** ලෙස සඳහන් කළ යුතුය. (අයදුම්කරුගේ නම: **අංජලී**)

අයදුම්පත්‍රයේ අංක 02 හි අයදුම්කරුගේ සම්පූර්ණ නම: **අංජලී කුගන්** ලෙස සඳහන් කළ යුතුය.

08.3. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"NP/07/10/01/181"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.4. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.5. අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් පිළිබඳව අදාළ අයදුම්කරුවන් වෙත දන්වා යවනු ලැබේ.

08.6. ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව ඉල්ලීම් ලිපියක් මගින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **exampscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් මුදල් ඇණවුමේ සහතික කළ පිටපතක්

**09. අත්සන සහතික කිරීම**

**සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ.** දැනට රාජ්‍ය සේවයේ නිරත පුද්ගලයෙකු මේ සඳහා අයදුම් කරන්නේ නම් ඔහු/ඇය තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ස්ථිර රාජ්‍ය හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

**10. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම**

10.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය.

10.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රොනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

**11.** අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

**12.** විභාග පරිපාටිය

**12.1** ලිඛිත පරීක්ෂණය

මෙම ලිඛිත පරීක්ෂණය පහත දැක්වෙන පරිදි ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. මෙම විභාගය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අයදුම්කළ අයදුම්කරුවන් දෙමළ භාෂා මාධ්‍යයෙන් ද, සිංහල මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අයදුම්කළ අයදුම්කරුවන් සිංහල භාෂා මාධ්‍යයෙන් ද, ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අයදුම්කළ අයදුම්කරුවන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් ද විභාගයට පෙනී සිටිය යුතුය. අයදුම්පතේ සඳහන් කරන ලද විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අනු අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | ගුරු වෘත්තිය සඳහා අයදුම්කරුවන්ගේ ඇති හැකියාව, තර්කානුකූල හැකියාව පිළිබඳව පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විතය. මෙය බහුවරණ සහ කෙටි පිළිතුරු අපේක්ෂා කෙරෙන ප්‍රශ්න 50 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 යි | 100 |
| 02 | සාමාන්‍ය දැනීම | ගුරු වෘත්තියට අදාළ සහ ගුරු වෘත්තිය පිළිබඳ සාමාන්‍ය දැනීම, දේශීය වශයෙන් ලබා ඇති සහ ලබාගත යුතු අධ්‍යාපනයේ ප්‍රගතිය පිළිබඳ සාමාන්‍ය දැනුම සහ අධ්‍යාපන දියුණු කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කෙරෙන බහුවරණ සහ කෙටි පිළිතුරු අපේක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |

සටහන:- මෙය තරඟ විභාගයක් බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට නම් අයදුම්කරුවන් විසින් එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා වෙන් කර ඇති ලකුණු සංඛ්‍යාවෙන් අවම වශයෙන් **සියයට හතළියක් (40%)** ලබාගත යුතුය.

**12.2** ප්‍රායෝගික පරීක්ෂණය

සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගත් අයදුම්කරුවන් හට ප්‍රායෝගික පරීක්ෂණය ලෙස අයදුම්කරුවන් විසින් තෝරාගත් මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීම් ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන කාණ්ඩ | උපරිම ලකුණු සංඛ්‍යාව | සමත්වීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අරමුණ සහ ප්‍රවේශය **(Objective and the Approach)** | 05 | 02 |
| 2 | පෞරුෂය සහ හඬ පාලනය **(Personality and Voice Control)** | 05 | 02 |
| 3 | සන්නිවේදනයේ පැහැදිලිබව **(Clarity in the Communication)** | 05 | 02 |
| 4 | කාල කළමනාකරණය **(Time Management)** | 05 | 02 |
| 5 | ඉදිරිපත්කිරීමේ ශිල්පීය ක්‍රම භාවිතය **(Usage of Techniques of Presentation)** | 05 | 02 |
| | මුළු ලකුණු | **25** | **10** |

**13.** විභාග මධ්‍යස්ථානය

13.1 විභාගය පැවැත්වීමට නියමිත නගර සහ නගර අංක පහත දැක්වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිළිනොච්චි | 04 |
| මුලතිවු | 05 |

13.2 කෙසේ වෙතත්, ලැබෙන අයදුම්පත් ප්‍රමාණය අනුව අයදුම්කරුවන් තෝරාගන්නා විභාග මධ්‍යස්ථානය වෙනස් කිරීම පිළිබඳ තීරණය කිරීමේ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ ලේකම් සතුය.

**14.** විභාග ප්‍රතිඵල

අයදුම්කරුවන්ගේ සම්පූර්ණ විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**සැළකිය යුතුය:-**

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iii. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

iv. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**පී. කුගනාදන්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
2025.06.19